ඒකාබද්ධ මාධ්‍ය නිවේදනය

2016 නොවැම්බර් 05

ඉන්දියාව හා ශ්‍රී ලංකාව, 2016 නොවැම්බර් 5 වැනි දින එනම් අද දින නව දිල්ලි නුවර දී ධීවරයන්ගේ ගැටලු පිළිබඳව අමාත්‍ය මට්ටමේ සාකච්ඡා පැවැත්වීය. ඉන්දියාවේ විදේශ කටයුතු ඇමතිනි සුෂ්මා ස්වරාජ් මහත්මිය හා කෘෂිකර්ම හා ගොවි සුබ සාධන අමාත්‍ය රාධා මෝහන් සිං මහතා, ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍ය මංගල සමරවීර හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය මහින්ද අමරවීර යන මහත්වරුන් හමුවිය. ප්‍රවාහන, මහාමාර්ග හා නාවික කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය පොන් රාධා ක්‍රිෂ්ණන් මහතා සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. ඒ. සුමන්තිරන් මහතා ද මෙම නියෝජිත කණ්ඩායම් දෙකට අයත් වූහ.

ධීවරයන් සම්බන්ධයෙන් වූ ගැටලුවලට සිථිර විසඳුමක් සෙවීමට උපයෝගිකර ගත හැකි යාන්ත්‍රණයක් පිළිබඳව මෙහිදී අමාත්‍යවරු අදහස් පළ කළහ.

සෑම මාස තුනකට වරක් රැස්වන ධීවර කටයුතු පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමක් හා මාස හයකට වරක් ධීවර අමාත්‍යවරුන් අතර රැස්වීමක් පැවැත්වීමටත් ඔවුහු එකඟ වූහ. දෙරටේ විදේශ කටයුතු අමාත්‍යාංශවල, වෙරළ ආරක්ෂක භටයන්ගේ හා නාවික හමුදාවල නියෝජිතයින්ගෙන් මෙම නියෝජිත කණ්ඩායම් සමන්විත වනු ඇත. පළමු අමාත්‍ය මට්ටමේ රැස්වීම 2017 ජනවාරි 02 වැනි දා කොළඹදී පැවැත්වීමට නියමිතය.

( i ) මුහුදු පත්ලේ ට්‍රෝලර් යාත්‍රා භාවිතයෙන් මසුන් ඇල්ලීම හැකි ඉක්මනින් නැවැත්වීම සඳහා කඩිනම් පියවර ගැනීම. ( ii ) අත් අඩංගුවට ගනු ලැබූ ධීවරයන් භාරදීමේ සම්මත මෙහෙයුම් ක්‍රියාමාර්ග (SOP's) ස්ථාපිත කිරීම සඳහා අනුගමනය කළයුතු වැඩ පිළිවෙල සැකසීම සහ (iii) වෙරළ ආරක්ෂක මුර සේවය පිළිබඳ සහයෝගීතාව ඇති කිරීමට ඇති ඉඩකඩ සොයා බැලීම මෙම ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ කාර්ය නිර්දේශයට අයත් වනු ඇත. රඳවා ගනු ලැබූ ධීවර යාත්‍රා නිදහස් කිරීමේ ගැටලුව පිළිබඳව, ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ පළමු රැස්වීමේ දී සාකච්ඡා කිරීමට නියමිතය.

දෙරටේ වෙරළාරක්ෂක භටයන් අතර ක්ෂණික ඇමතුම් සේවාවක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ද දෙපාර්ශ්වයේ එකඟතාව පළ වුණි.

ධීවරයන්ට සන්නිවේදන උපකරණ ලබාදීම කඩිනම් කිරීම සඳහා ද සහාය පළවිණි.

දෙරටේ නාවික හමුදා සහ වෙරළාරක්ෂක භටයින් ධීවරයන් පිළිබඳව කටයුතු කිරීමේ දී ප්‍රචණ්ඩත්වය හා ජීවිත අහිමිවීම් නොතිබිය යුතු බවට ධීවර සංගම් විසින් කරන ලද ප්‍රකාශයට දෙරටේම එකඟතාවය පළවිය.

2016 නොවැම්බර් 2 වැනි දා නව දිල්ලි නුවරදී පැවති ධීවර සංගම් රැස්වීමෙන් අනතුරුව ඔවුන්ගේ සංවාද දිගින් දිගටම පවත්වාගෙන යාම සඳහා සෑම මාස හයකටම වරක් රැස්වීමට දෙරටේ ධීවර සංගම් දිරිමත් කිරීමට ඔවුහු මෙහිදී කැමැත්ත පළ කළහ.

දැනට අත් අඩංගුවේ පසුවන දෙරටේම ධීවරයින් නිදහස් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලබමින් සිටින බව අමාත්‍යවරයා මෙහි දී ප්‍රකාශ කළේය.